// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2411/32 - 2024 නොවැම්බර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2024.11.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

### 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත

1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ මුදල් සමාගම් විසින් තැන්පතු කැඳවීම සම්බන්ධව නිකුත් කළ විධානයන් සහ රීතිය අහෝසි කිරීම.

ආචාර්ය **පී. නන්දලාල් වීරසිංහ,**
පාලක මණ්ඩලයේ සභාපති සහ
මහ බැංකුවේ අධිපති.

කොළඹ.
2024 නොවැම්බර් මස 17 වැනි දින.

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ වන 2024 අංක 03 දරන මුදල් ව්‍යාපාර පනත (මුදල් සමාගම් විසින් තැන්පතු කැඳවීම) විධානය නිකුත් කිරීමෙන් පසුව, 2024 නොවැම්බර් මස 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි, 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ නිකුත් කරන ලද පහත විධානයන් සහ රීතිය අහෝසි කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් තීරණය කර ඇති බව මහජනතාව වෙත මින් දැනුම් දෙනු ලැබේ.

1. **2005 අංක 01 දරන මුදල් සමාගම් (තැන්පතු) විධානය** - මෙම විධානය 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ 2005 ජනවාරි මස 31 වන දින මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ අතර, 2005 පෙබරවාරි මස 01 දිනැති අංක 1378/12 දරන රජයේ *ගැසට් පත්‍රයෙහි (අති විශෙෂ)* පළකර ඇත.

2. **2001 අංක 05 දරන මුදල් සමාගම් (තැන්පතු - දිරිගැන්වීමේ යෝජනා ක්‍රම) විධානය** - මෙම විධානය 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ 2001 මැයි මස 25 වන දින මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ අතර, 2001 මැයි මස 25 දිනැති අංක 1185/30 දරන රජයේ *ගැසට් පත්‍රයෙහි (අති විශෙෂ)* පළකර ඇත.

3. **2006 අංක 01 දරන මුදල් සමාගම් (ප්‍රචාරක දැන්වීම්) රීතිය** - මෙම රීතිය 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ 2006 දෙසැම්බර් මස 29 වන දින මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ අතර, 2007 ජනවාරි මස 01 දිනැති අංක 1478/6 දරන රජයේ *ගැසට් පත්‍රයෙහි (අති විශෙෂ)* පළකර ඇත.

4. **2010 අංක 02 දරන මුදල් සමාගම් (තැන්පතු වගකීම් රක්ෂණ) විධානය** - මෙම විධානය 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ 2010 සැප්තැම්බර් මස 27 වන දින මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ අතර, 2010 ඔක්තෝබර් මස 29 දිනැති අංක 1677/33 දරන රජයේ *ගැසට් පත්‍රයෙහි (අති විශෙෂ)* පළකර ඇත.

EOG 11 - 0129

1A - G 43103 — 24 (2024/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*